**ශීර්ෂය 254 – රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1 හි ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 02 ක් ද, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125 (1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 09 දින දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.14 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබූ බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරියාගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරි සැලැස්මට අනුකූල නොවීම. | 2.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම. | 2.3 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.8 |
| | | 4. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. | 2.2 |
| | | 5. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2 |
| 128(1)(ආ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | අනුකූල නොවීම. | 2.12 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බවටත්, ඒවා වරින් වර සත්‍යක්ෂණය කරනු ලබන බවටත් ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | 1. හිඟ හිටි ආදායම් අයකර ගැනීම.<br>2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම. | 2.9(අ)(i)<br>2.10(අ) |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කරනු ලබන බව. | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.8 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ /සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව . | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.6 (ආ) |

| | | | |
|---|---|---|---|
| 128 (2)(අ) | ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත්, හැකිතාක් නිවැරදිවත් පිළියෙල කිරීම. | අපේක්ෂිත ආදායම රැස්කිරීමට නොහැකි වීම. | 2.9 (ආ)(i) |
| 128(2)(ඈ) | එකතු කර ගැනීම සම්බන්ධයෙන් තමා වගකීමට බැඳී ඇති රාජ්‍ය ආදායමෙන් යම් කොටසක් වෙනත් දෙපාර්තමේන්තු හා කාර්යාල මඟින් එකතු කරනු ලැබේනම්, ඒ දෙපාර්තමේන්තුවලින් හා කාර්යාලවලින් වාර්තා ලබාගෙන ඒවායේ සඳහන් කරුණු, රාජ්‍ය ආදායම් ඇස්තමේන්තුවලටද පිළිවෙළින් පූර්වෝක්ත (අ) ඡේදය ප්‍රකාරව තමා විසින් පිළියෙල කරන රාජ්‍ය ආදායම් ගිණුම්වල හා වාර්තාවල ද අන්තර්ගත කරන බව. | ආදායම් රැස්කරන අනෙකුත් දෙපාර්තමේන්තුවලින් ආදායම් ඇස්තමේන්තු සඳහා තොරතුරු කැඳවා නොතිබීම. | 2.9 (අ) (i) |
| 128(2)(ඉ) | රාජ්‍ය ආදායම් එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන්දීමේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා, රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදන බව. | ආදායම් සංකේතයට අදාළව ආදායම් රැස්කරන ආයතනවලින් හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු නියමිත පරිදි කැඳවා ලබාගෙන නොතිබුණි. | 2.9 (අ)(ii) |
| 128(2)(උ) | රාජ්‍ය ආදායම් එකතු කර ගැනීමට කටයුතු කරන විවිධ දෙපාර්තමේන්තුවලින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමද, උචිත ආදායම් සංකේතය යටතේ එකතු කරනු ලබන මුදල් පිළිබඳ වාර්තා තබා ගන්නා බවටද, ඒ ඒ ආදායම් සංකේතය යටතේ එකතු කරන ලද ආදායම පිළිබඳ භාණ්ඩාගාරය තබා ගෙන ඇති ගිණුම් සමඟ එකඟ වාර්තා සටහන් සැසඳෙන බව. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ සංඛ්‍යා පදනම් කරගෙන ආදායම් ගිණුම පිළියෙල කර තිබීම. | 2.9 (අ)(i) හා (ආ)(i) |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

**2.1 කාර්යසාධනය**

-------------

**සැලසුම් කිරීම**

---------------

දෙපාර්තමේන්තුව යටතේ වාර්ෂිකව අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතු ඊ - ජනගහන ලේඛන වැඩසටහන සහ ඊ - උපත්, විවාහ හා මරණ වැඩසටහන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

## 2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

සමාලෝචිත වර්ෂය තුළ හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලට ලැබී තිබූ හිමිකම් උපලේඛන 60,134 කින් වර්ෂය අවසානය වන විට උපලේඛන 43,202 ක් ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබූ අතර, වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද උපලේඛන 49,697 කින් උපලේඛන 32,765 ක් පෙර වර්ෂයේ ලද උපලේඛන විය.

### (ආ)

2014 මැයි 29 දිනැති අංක 1864/44 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රෝනික ගනුදෙනු පනතේ 2 හා 11 වගන්ති ප්‍රකාරව 2012 ජූලි මස 10 වන දින සිට බලාත්මක වන පරිදි උපත් හා මරණවලට අදාළ දත්ත ඉලෙක්ට්‍රෝනික ආකාරයට ගොනු කිරීම, නිර්මාණය කිරීම, සුරක්ෂිතව රඳවා තබා ගැනීම හා නිකුත් කිරීම කළයුතු වුවත් 2012 ජූලි 10 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සිදු වූ උපත් 1,891,372 කින් උපත් 1,316,100 ක් ද, මරණ 716,181 කින් මරණ 445,749 ක් ද මෙම තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමට ද ඒ ආශ්‍රයෙන් සහතික පිටපත් නිකුත් කිරීමට ද නොහැකි වී තිබුණි.

### (ඇ)

ඊ - උපත්, විවාහ හා මරණ වැඩසටහන යටතේ 1960 වර්ෂයේ සිට උපත්, විවාහ හා මරණ සහතික පරිලෝකනය කිරීමේ කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කරන ලදි. එසේ වුවද, 1960 – 1990 කාල පරිච්ඡේදයට අයත් තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබූ අතර 1991 – 2011 කාලය තුළ සිදු වූ උපත්, විවාහ හා මරණ 14,339,280 ක් ද, 2012 – 2017 වර්ෂ අතර කාලය තුළ සිදු වූ උපත්, විවාහ හා මරණ 3,921,020 කින් 1,438,285 ක් හෙවත් සියයට 36 ක් ද පරිලෝකනය කර නොතිබුණි. කෙසේ වුවද, අදාළ සහතික දිස්ත්‍රික්ක 4 ක එම දිස්ත්‍රික්කයේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි වුවත් ඉතිරි දිස්ත්‍රික්ක 21 හි සහතික ලබාගත හැක්කේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පමණි.

### (ඈ)

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" ට අනුගත වීම සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් 2016 වර්ෂයේ සිට තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කළ යුතු වුව ද දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව දැනුවත් වී නොතිබීමෙන් අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම, අවශ්‍ය මානව හා භෞතික සම්පත් හඳුනා ගැනීම, ප්‍රතිපාදන වෙන් කර ගැනීම, එම අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක සකස් කිරීම, ඒ සඳහා උනන්දු වන පාර්ශවයන් හඳුනා ගැනීම හා දැනුවත් කිරීම යනාදී වශයෙන් තිරසර සංවර්ධන ඉලක්කයන්ට ලඟා වීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබාගත යුතු වූ රු. මිලියන 163.35 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 153.63 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 9.72 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 5.95 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.3.1 ප්‍රසම්පාදන සැලසුම් කිරීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය

-------------------------------------------------------

මෙම අදියර යටතේ පහත සඳහන් සැලැසුම් හා ලියකියවිලි පිළියෙල කර නොතිබුණි.

(i) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලයක් සඳහා යාවත්කාලීන කිරීම.

(ii) ප්‍රසම්පාදන පැකේජ සාරාංශය.

(ආ) පූර්ව කොන්ත්‍රාත් අවධිය

----------------------------

මෙම අදියර යටතේ පහත සඳහන් සැලසුම් හා ලියකියවිලි පිළියෙල කර නොතිබුණි.

(i) එකිනෙක කොන්ත්‍රාත් පැකේජ සඳහා ප්‍රසම්පාදන කාල උපලේඛනය.

(ii) වැඩ, භාණ්ඩ හා සේවා සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම.

**2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

----------------------------------------

දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සැපයීම් හා සේවා ලබා ගැනීමේදී පහත සඳහන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධානවලට අනුකූල නොවී මිලදී ගැනීම් සඳහා ගෙවීම් කර තිබුණු අවස්ථා අනාවරණය විය.

(අ) 2017 වර්ෂයේ සැලසුම් සකස් කිරීමේදී මූලිකත්වය දැක්විය යුතු ප්‍රසම්පාදන කාර්යයන් ලෙස ජනවාරි - නොවැම්බර් කාලය තුළ පරිගණක අත්පත් කර ගැනීමට සඳහන් කර තිබුණද නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හි ප්‍රසම්පාදන කටයුතු සිදුකර රු. 4,753,575 ක් වටිනා පරිගණක 40 ක් මිලදී ගෙන තිබීමෙන් මනා සැලසුම්කරණයක් යටතේ කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ඡායා පිටපත් සේවාව, සනීපාරක්ෂක සේවාව හා ආරක්ෂක සේවාව සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු. 122,521,261 ක් වූ අතර එම ප්‍රසම්පාදනයන්හි දී පහත සඳහන් ආකාරයට 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව කටයුතු කර තිබුණි.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ 2014 ජුලි 04 දිනැති අතිරේක අංක 28 හි 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් නොකර ප්‍රසම්පාදන අධිකාරිය මුළු පිරිවැය තීරණය කර තිබීම.

(ii) ඡායා පිටපත් සේවාව හා ආරක්ෂක සේවා ප්‍රසම්පාදනයන්වලදී 5.3.13 හා 6.2.2 මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව එකතුව රු. 1,165,000 ක ලංසු සුරක්ෂණ අඩුවෙන් ලබාගෙන තිබීම හා ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 21 ක් ලබා නොදීම.

## 2.4 වත්කම් කළමනාකරණය

**වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට දෙපාර්තමේන්තුව සතුව වාහන 23 ක් පැවති අතර එම වාහනවල ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම නිසා ධාවනය කරන ලද දුර ප්‍රමාණය හඳුනාගත නොහැකි විය. එම වාහනවල ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු. 2,726,629 ක් ද, වාහන සේවා කිරීම සඳහා රු. 807,854 ක් ද, වාහන අළුත්වැඩියා සඳහා රු. 2,757,969 ක් ද, වාහන රක්ෂණය සඳහා රු. 1,011,495 ක් ද වශයෙන් එකතුව රු. 7,303,947 ක් වැයකර තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනයවීම පරීක්ෂා කර නොතිබුණි.

## 2.5 බැදීම් හා බැරකම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 593.691 ක ප්‍රතිපාදනය රු. මිලියන 11.037 කින් ඉක්මවා රු. මිලියන 16.264 ක බැරකම් ඇති කර ගෙන තිබුණි.

(ආ) ප්‍රතිපාදන වෙන්කළ ද අක්මුදල් නොලැබීම මත ගෙවීම් කිරීමට නොහැකි වූ අංක 153 වැය ශීර්ෂය යටතේ රු. මිලියන 6.57 ක බැරකම් සහ අංක 254 වැය ශීර්ෂය යටතේ ගෙවිය යුතු පාර්ශවය හා ගෙවීම් විස්තරය රහිතව රු. මිලියන 13.76 ක බැරකම් ඇති කර ගෙන තිබුණි.

(ඇ) 2018 වර්ෂයේදී සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවා තිබූ රු. 501,057 ක බැරකම් අනාවරණය කර නොතිබුණි.

## 2.6 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබූ ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | **වර්ෂය** | **ඡේද අංකය** | |
| (අ) | 2015<br>2016 | 3.1 (අ)<br>3.1 (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර ඉඩම්, ගොඩනැඟිලි, ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛන අවශ්‍ය තොරතුරු ඇතුළත්ව යාවත්කාලීන කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015<br>2016 | 3.1 (ඇ)<br>3.1 (ඇ) | මුදල් රෙගුලාසි 880 හා 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගෙන් ඇප මුදල් ලබා ගෙන ඇප ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015<br>2016 | 3.1 (ඉ)<br>3.1 (ඇ) | මුදල් රෙගුලාසි 1647 (ඇ) ප්‍රකාරව ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොතක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2016 | 3.1 (ඉ) | මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2015<br>2016 | 3.6.2<br>3.10 (ආ) | කාර්ය මණ්ඩලය 04 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ප්‍රධාන අභ්‍යන්තර විගණකයකු පත්කර නොතිබුණි. |
| (ඊ) | 2015<br>2016 | 3.6.4<br>3.10 (ඇ) | මාස දෙකකට එක බැගින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 06 ක් පැවැත්විය යුතු වුවත් එක් රැස්වීමක් පමණක් පවත්වා තිබූ අතර පෙර වර්ෂයන්හි තත්වයද ඒ ආකාරයටම විය. |
| (උ) | 2016 | 3.9 | පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2013 වර්ෂයේදී සිදු වී ඇති බවට අනාවරණය කරගෙන තිබූ පත්ඉරු නිකුත් කිරීමට අදාළ මුදල් අක්‍රමිකතාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍ර 104කාරව පරීක්ෂණ පවත්වා අදාළ අලාභ ගණනය කර අයකර ගැනීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකර ඊට වගකිව යුතු බවට හඳුනාගෙන තිබූ නිලධාරිනිය වෙනත් කාර්යාලයක් වෙත ස්ථාන මාරු කර තිබුණි. |

## 2.7 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කටයුතු හා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් මාරවිල, බදුල්ල, මීගමුව, අනුරාධපුරය, හොරණ, මන්නාරම හා කොටපොල යන ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල සිදුකළ පරීක්ෂණ කටයුතු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අත්පොත සමඟ නියැදි පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) නොතාරිස්වරුන් විසින් ලියා අත්සන් කළ ඔප්පුවල දෙවන පිටපත් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාරදිය යුතු වුවද ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 05 ක නොතාරිස්වරුන් 18 දෙනෙකු විසින් 2008 – 2017 කාලයට අදාළ දෙවන පිටපත් 446 ක් භාර දී නොතිබීමත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 06 ක නොතාරිස්වරුන් 65 දෙනෙකු විසින් ඔප්පු දෙවන පිටපත් ප්‍රමාද කර භාර දී තිබීමත්, සම්බන්ධයෙන් විධිහීනතා වාර්තා පිළියෙල කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඔප්පු දෙවැනි පිටපත් ලැබුණු දිනයේම අනුපිළිවෙලට නොතාරිස් පරීක්ෂණ පොතට ඇතුළත් කළ යුතු නමුත් එම කටයුතු බොහෝ ප්‍රමාද කර තිබීම හා ලේඛන යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් විධිහීනතා නිකුත් කිරීමටත්, සමථ, හිඟ හා දඩ මුදල් අයකිරීමටත් නොහැකි වී තිබුණි. තවද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට පරීක්ෂා කිරීමට නොහැකි වූ දෙවන පිටපත් සංඛ්‍යාව 2016 වර්ෂයේ ලද 59,876 ක් ඇතුළුව 145,664 ක් විය.

(iii) කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නොතාරිස්වරුන් 70 දෙනෙකු විසින් තමා කරන ලද වැඩ පිළිබඳ සති වාර්තා ලබා දී නොතිබීම නිසා විධිහීනතා හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඊ ලැන්ඩ් ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 81.23 ක වියදමකින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 15 ක ඉඩම් පත්‍රිකා 9,635,348 ක් පරිලෝකනය කර තිබුණද, පරිගණක පද්ධතියේ පවතින දෝෂ හේතුවෙන් මහජනයා වෙත පරිලෝකනය කරන ලද දත්ත ඇසුරින් සහතික පිටපත් නිකුත් කිරීමට නොහැකි වී තිබුණි. තවද, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 30 ක මිලියන 16 කට අධික ඉඩම් ලේඛන පරිලෝකන කටයුතු සිදු කළ යුතුව තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ වාහන ලොග් පොත්වල වාහන පිළිබඳ විස්තර, වාර්ෂික බලපත්‍ර ලබාගැනීම්, ටයර් මාරු කිරීම්, අළුත්වැඩියා කිරීම් හා සේවා කිරීම් යන තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන කරගෙන නොතිබුණි.

(ඈ) මධ්‍යම ලේඛනාගාරය හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 27 කට සමාලෝචිත වර්ෂයේ බාහිර පාර්ශවයක් මඟින් ඡායා පිටපත් සේවය ලබා ගැනීමේ වියදම රු. 56,592,603 ක් වූ අතර එය වාර්ෂිකව අඛණ්ඩව දරනු ලබන වියදමක් විය. බාහිර පාර්ශවයක් මඟින් මෙම සේවාව ලබා ගැනීම, දෙපාර්තමේන්තුව තුළින් මෙම සේවාව ලබා ගැනීමට වඩා වාසිදායකද යන්න පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවට අයත් දිවයින පුරා පිහිටි කාර්යාල 53 කට සනීපාරක්ෂක සේවාව සැපයීම සඳහා වැඩ පරීක්ෂකවරුන් 16 දෙනෙකු පමණක් ඇතුළත් වන ආකාරයට මිල ගණන් කැඳවා කාර්යය පවරා තිබීමෙන් දෙපාර්තමේන්තුවේ කාර්යාලවල පවිත්‍රතා කටයුතු නිසි පරිදි සිදුවන බව නිරීක්ෂණය නොවුණි.

### 2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 788.649 | 785.469 | 3.180 | 0.4 |
| | මූලධන | 64.850 | 49.663 | 15.186 | 23.40 |
| | **එකතුව** | **853.499** | **835.132** | **18.366** | **2.20** |
| 2014 | පුනරාවර්තන | 1,041.100 | 1,015.454 | 25.646 | 2,46 |
| | මූලධන | 53.100 | 47.430 | 5.670 | 10.68 |
| | **එකතුව** | **1,094.200** | **1,062.884** | **31.316** | **2.86** |
| 2015 | පුනරාවර්තන | 1,261.200 | 1,217.42 | 43.748 | 3.46 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන | 64.000 | 54.593 | 9.407 | 14.69 |
| | **එකතුව** | **1,325.200** | **1,272.045** | **53.155** | **4** |
| 2016 | පුනරාවර්තන | 1,341.400 | 1,324.982 | 16.418 | 1.22 |
| | මූලධන | 113.600 | 101.286 | 12.314 | 10.83 |
| | **එකතුව** | **1,455.000** | **1,426.268** | **28.732** | **1.97** |
| 2017 | පුනරාවර්තන | 1,342.020 | 1,330.650 | 11.370 | 0.84 |
| | මූලධන | 76.000 | 46.273 | 29.727 | 39.11 |
| | **එකතුව** | **1,418.020** | **1,376.923** | **41.097** | **2.89** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විසර්ජන ගිණුම**
**----------------**

(අ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වැය විෂයයන් 07 ක් සඳහා රු. මිලියන 7.14 ක් මාරු කරගෙන තිබූ අතර, අධි ප්‍රතිපාදන සලසාගෙන තිබූ තවත් වැය විෂයයන් 09 කින් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම රු. මිලියන 7.8 ක් විය.

(ආ) විදේශ ගමන් වැය විෂයය සඳහා සලසා තිබුණු රු. 500,000 ක මුළු ප්‍රතිපාදනය මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කරගෙන තිබූ අතර තවත් වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 7 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් වැය විෂයයන් 07 ක රු. මිලියන 11.0 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 4.3 ක ඉතිරිවීම් සියයට 18 ක සිට සියයට 85 ක් අතර පරාසයක විය.

(ඈ) රක්ෂණය නොකරන ලද ලොරි රථයක් අනතුරකට ලක් වීමෙන් සිදු වී තිබූ රු. 433,649 ක අලාභය රු. 162,617 ක් වශයෙන් විසර්ජන ගිණුමේ දක්වා තිබූ අතර කපාහැරීමට අනුමැතිය ලැබී තිබූ රු. 271,029 ක් විසර්ජන ගිණුමේ පොත්වලින් කපාහැරීමේ ප්‍රකාශය මඟින් අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට වාහන, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල විසර්ජන ගිණුමේ සඳහන් ශේෂයට වඩා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනෙහි ශේෂය රු. මිලියන 245.5 ක් අඩුවෙන් දැක් වූ අතර, විසර්ජන ගිණුමේ ඇතුළත් රු. මිලියන 375.2 ක ගොඩනැඟිලි හා ඉදිකිරීම් ද, රු.මිලියන 1,498.4 ක ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් ද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනට ඇතුළත් වී නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූල අයිතිය පවරා නොගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ ඉඩම් හා ගොඩනැඟිලි දේපල 18 කින් දේපල 13 ක ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් වටිනාකම රු. 719,570,000 ක් සහ ගොඩනැඟිලි හා ඉදිකිරීම් වටිනාකම රු. 106,806,356 ක් වශයෙන් විසර්ජන ගිණුමට ඇතුළත් කර තිබුණි. තවත් දේපල 11 ක ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් වටිනාකම රු. 741,252,851 ක් සහ ගොඩනැඟිලි හා ඉදිකිරීම් වටිනාකම රු. 264,960,683 ක් වශයෙන් විසර්ජන ගිණුමට ඇතුළත් කර තිබූ නමුත් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබූ අතර එයින් දේපල 10 ක අයිතිය දෙපාර්තමේන්තුව සතු බවට සනාථ කර නොතිබුණි.

(උ) හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්භාරයන් සඳහා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ (ශීර්ෂ 153) වැය ශීර්ෂයෙන් රු.මිලියන 28.5 ක් වූ ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් රු. මිලියන 13.6 ක් හෙවත් සියයට 48 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**2.9 ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම්**

**---------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් යටතේ එකතුව රු. මිලියන 1,320 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. මිලියන 1,297.4 ක ආදායමක් රැස්කරගෙන තිබුණි.

**(අ) 10: 03: 07: 00 දරන ආදායම් සංකේතය - ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම්**

**--------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් තොරතුරු ලබා නොගෙන රු. මිලියන 1,100 ක් ලෙස සකස් කළ මූලික ආදායම් ඇස්තමේන්තුව මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 1,400 ක් වශයෙන් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කර පසුව එය රු. මිලියන 1,300 ක් වශයෙන් සංශෝධනය කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ හිඟහිටි ආදායම රු. මිලියන 21. 83 කින් වර්ෂය තුළ අයකර ගැනීම් රු. මිලියන 5.17 ක් වූයෙන් 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම රු. මිලියන 16.66 ක් විය. මෙම හිඟහිටි ආදායම වර්ෂ 01 ක සිට වර්ෂ 03 කට වැඩි කාල පරාසයකට අයත් විය. තවද, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල හිඟ ආදායම් ශේෂ එකතුවට වඩා ප්‍රධාන කාර්යාලයේ වාර්තාවල හිඟ ආදායම් ශේෂය රු. මිලියන 7.13 ක වෙනසක් පැවතියද ප්‍රධාන කාර්යාලයේ හිඟ ආදායම් ශේෂය ගිණුම්ගත කර තිබුණි.

(iii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ තත්‍ය ආදායම රු. මිලියන 42 කින් වැඩි වී තිබුණි. මහජනයා විසින් ඉඩම් ලේඛනවල සහ උපත්, විවාහ හා මරණ සහතිකවල සහතික පිටපත් ලබා ගැනීම ඉහලයාම එම වැඩි වීමට හේතු වී තිබුණි.

(iv) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් නියමිත පරිදි මාසික ආදායම් වාර්තා ලබාගෙන රැස්කළ ආදායම සමඟ සසඳා නොතිබුණි.

**(ආ) 10:03:08:00 දරන ආදායම් සංකේතය නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු ආදායම්**

**-----------------------------------------------------------------------------------------** පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයේ ඉපැයූ රු. මිලියන 15.9 ක ආදායම පිළිබඳ සැලකිල්ල යොමු නොකර මහා භාණ්ඩාගාරය විසින් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 24 ක් වශයෙන් පුරෝකතනය කර වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කර පසුව එය රු. මිලියන 20 ක් වශයෙන් සංශෝධනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ඉපැයූ ආදායම රු. මිලියන 15.4 ක් වීමෙන් රු. මිලියන 4.6 කින් තත්‍ය ආදායමට ළඟා වීමට නොහැකි වී තිබුණි.

(ii) 2016 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල නොතාරිස් නාමලේඛන යාවත්කාලීනව පවත්වා ඒ ඒ අධිකරණ කලාප යටතේ ලියාපදිංචි වී ඇති නොතාරිස්වරුන් ප්‍රසිද්ධියට පත් කර නොතිබුණි. වාර්ෂික සහතිකය ලබා නොගෙන නොතාරිස් රාජකාරියේ යෙදෙන නොතාරිස්වරුන් පිළිබඳව සොයාබලා නොතිබූ අතර, කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නොතාරිස්වරුන් 735 දෙනෙකු වාර්ෂිකව සහතික අළුත්කර ගෙන නොතිබුණි.

(iii) නොතාරිස්වරුන් අළුතින් ලියාපදිංචි වීමේ ගාස්තුව රු. 2,000 ක් හා ලියාපදිංචිය අළුත්කිරීමේ ගාස්තුව රු. 1,000 ක් වීමෙන් රැස්කළ මුළු ශුද්ධ ආදායමේ අවසාන ඉලක්කම් “000” වශයෙන් විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු. 15,399,561 ක් වීම හේතුවෙන් එහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

(iv) මහාධිකරණ කලාප 09 කින් එකතුව මාස 25 ක දී ආදායම් වාර්තා ලබාගෙන රැස්කළ ආදායම සමඟ සසදා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබූ රු. මිලියන 23.13 ක හිමිකම් ආදායම හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල ආදායම් වාර්තා හා බැංකු තැන්පතු පත්‍රිකා සමඟ සසදා නොතිබීමත්, බැංකුවට බැර වූ රු. මිලියන 1.08 ක් හඳුනාගෙන නොතිබීමත්, හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් ගිණුමට බැරකළ ආදායම හා ඔවුන්ගේ ආදායම් වාර්තා අතර වෙනස්කම් පැවතීමත් හේතුවෙන් රැස්කළ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට සියයට 60 ක් හා හිමිකම් රක්ෂණ අරමුදලට සියයට 40 ක් මාරු කිරීමේ නිවැරදිතාවය සනාථ කරගත නොහැකි විය.

**2.10 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 25401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | **හර ශේෂය** | | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 80.00 | 79.99 | 50.00 | 57.29 | 230.00 | 203.34 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟහිටි ණයශේෂ අයකර නොගැනීම

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව නිලධාරීන් 77 දෙනෙකුගෙන් අයවීම් හිඟහිටව තිබුණු ණය ශේෂවල එකතුව රු. මිලියන 2.41 ක් වූ අතර එම හිඟහිටි ශේෂ මාස 01 ක සිට වර්ෂ 27 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) උපරිම හර ශේෂ සීමාව

ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු. 992,427 ක ණයශේෂ පියවීමට අදාළව ජර්නල් සටහන් යෙදීමේදී සිදු වූ වරද දෙපාර්තමේන්තුවේ පොත්වල නිවැරදි කරනු ලැබුවද භාණ්ඩාගාරයේ පොත්වල නිවැරදි නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ රු. 80,000,000 ක් වූ උපරිම වියදම් සීමාව රු. 989,927 කින් ඉක්මවා වියදම රු. 80,989,927 ක් වශයෙන්

භාණ්ඩාගාර පරිගණක සටහන්වල දැක්වුවද දෙපාර්තමේන්තුවේ පොත් අනුව තත්‍ය වියදම රු. 79,997,500 ක් විය.

**2.11 අග්‍රිම ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2017 දෙසැම්බර් මස බැංකු සැසඳුම අනුව නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ රු.153,710 ක චෙක්පත් පැවතීම, බැංකුවට සෘජු බැරකිරීම් රු.104,138 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම, තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ තැන්පතු රු.9,225 ක් නිරවුල් නොකිරීම යනාදී කරුණු හේතුවෙන් මහා භාණ්ඩාගාරයට අග්‍රිම පියවීම නිවැරදි බවට සනාථ කළ නොහැකි විය.

**2.12 අනුකූල නොවීම්**

**2.12.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ සේවාවන් 3 කට අදාළව සැපයුම්කරුවන් 4 දෙනෙකු වෙත ගෙවා තිබූ වැට් බදු රු. 14,645,248 ක වටිනාකම පිළිබඳ මාසික වාර්තා විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

**2.13 විගණන හා කළමනාකරණ කමිටුව**

2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(I)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව විසින් විගණකාධිපති වාර්තා සමාලෝචනය කර අදාළ ක්‍රියාමාර්ග ගැනීම, කාර්යසාධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම ඇගයීම, සම්පත් පරිපාලනය හා සංවර්ධනය කිරීම සමාලෝචනය, කමිටුවේ කාර්යසාධනය වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම විමර්ශනය කිරීම යනාදී කරුණු සාකච්ඡා කර නොතිබුණි.

**2.14 මානව සම්පත් කළමනාකරණය**

**2.14.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක් වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 133.08 ක් වැයකර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | සේවකතථ්‍ය සංඛ්‍යාව | සේවකපුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 16 | 25 |
| (ii) | තෘතියික මට්ටම | 588 | 522 | 66 |
| (iii) | ද්විතියික මට්ටම | 1,569 | 1,301 | 268 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 464 | 400 | 64 |
| | | 2,662 | 2,239 | 423 |

| | | | |
|---|---|---|---|
| එකතුව | ===== | ==== | === |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 25 ක් වූයෙන් එය අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 61 ක ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා ඍජුවම මැදිහත් වන ද්විතියික සහ තෘතියික මට්ටමේ තනතුරු 332 ක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපානු හැකි බව විගණනයේදී බැහැරකළ නොහැකි විය.

**2.14.2 කාර්ය මණ්ඩල පුහුණු කිරීම**

**----------------------------**

දෙපාර්තමේන්තුවේ පසුගිය වර්ෂ 5 තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණු ප්‍රමාණය සියයට 14.6 ත් සියයට 37.6 ත් අතර පරාසයක පිහිටා තිබීමෙන් කාර්යමණ්ඩල පුහුණුව සතුටුදායක මට්ටමක නොපවතින බවට නිරීක්ෂණය කෙරේ. ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය තුළ අවශ්‍ය පුහුණු වැඩසටහන් හා කාර්යමණ්ඩලය ඇතුළත්ව සැලසුම් සකස් කර මෙහෙයවීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව තුළ නොතිබුණි.